# අන්තෝ ජටා

මා එදා ක්වාලාලම් පුරයට ගියේ සති දෙකක විශේෂ දේශන මාලාවක් පැවැත්වීමට මලයා විශ්ව විද්‍යාලයෙන් ලැබුන ආරාධනයක් මත. පසු ගිය සති කිහිපය තුල කොළඹ ඇති  ග්‍රීස්මයද නොතකා මා වෙහෙසුනේ 'ආසියාවේ ආර්ථික සංවර්ධණය එදා සහ අද' පිළිබඳ කරුණු සොයා මලයාසියාව, ආසියාවේ අනෙකුත් රටවල් වලට වඩා වේගයෙන් ඉදිරියට යන රටක් යැයි යන සංකල්පය (hypothesis) තහවුරු කිරිමට සාධක සොයා ගැනීමට. මේ කොළඹ - ක්වාලලම්පූර් කෙටි දුරත්, සති දෙකක පමණ කුඩා කාලයත් මා සිතට ඉතා වෙහෙස ගෙන දෙන්නක් වූයේ මා දන්නා කිසිවකු මෙහි ඉන්නා බවට කිසිම හෝඩුවාවක් නොලැබුන නිසා. කෙසේ වෙතත් මා ලියා අවසන් කිරීමට තිබෙන කෙටිකතා සංග්‍රහයට තවත් කතාවක් මේ කාලය තුලදී එකතු කිරීමට මා තරයේ අදිටන් කර ගත්තේ සිතේ කාන්සිය දුරු කර ගැනීමටත් එක්ක. විශ්ව විද්‍යාලය අසල ඇති සුඛෝපභෝගී හෝටලය වෙත එන තුරු මා සිටියේ මාගේ දේශන මාලාවත්, කෙටිකතා සංග්‍රහයත් අතර. කාමරය වෙත මා ඇරල වූ විශ්ව විද්‍යාලයේ රියදුරු තැන, ඔහුගේ ටෙලිෆෝන් අංකය මට දුන්නේ අවශ්‍ය නම් ඕනෑම වෙලාවක කතා කරන ලෙස ඉතා ගෞරවයෙන් සඳහන් කරමින්. හෙට සෙනසුරාදා නිසා ක්වාලලම්පූර් නගරයටත්, බෞද්ධ විහාරයටත් යාමට අදිටන් කරගත් මා නින්දට යන විට රාත්‍රී එකට පමණ ඇති. එතකොටම කෝල් එකක්.

'හලෝ රණේ මම ධම්මි. කොහොමද කරදරයක් නැතිව ආවද?'

'ඔව් ඔව්. මම මේ නෝට්ස් ටිකක් කියවල  බැලුවා. ලංකාවෙ වෙලාව දැන් දහයට විතර ඇති නේද? මෙහෙ පාන්දර එකයි.'

'ඔව් මමත් කම්මැලි නිසා ටීවී එක බල බල හිටිය.'

'කෝ දුවයි පුතයි?'

'තාත්ත නැතිව පාලුයි කියල අද වේලාසනින්ම නින්දට ගියා.'

'ඒක තමයි. එයාලට පංති නැතිනම් අපි හතර දෙනාටම එන්න තිබුණ නේ.'

'කමක් නැහැ රණේ. ලබන සැරේ අපි ඔක්කොම යමු. මමත් තවම ක්වාලලම්පූර් ගිහිල්ල නැහැනේ.'

'ඔව් ඔව් මේකත් බලන්නම ඕන රටක්''

'එහෙනම් ගුඩ්නයිට් රණේ. මම හෙට කතා කරන්නම්.'

'ඕකේ.  ගුඩ්නයිට්'

සෙනසුරාදා සවස සෙන්ට්‍රල් දුම්රිය පොලේත්, ඒ අතර නගරයේත් ටික වේලාවක් ඇවිදිමින් කාලය ගත කළ මා බ්‍රික්ෆීල්ඩ් විහාරයට යන විට හවස හයට විතර ඇති. මා විහාරයට ඇතුල් වන විටම කව්දෝ ඉදිරියට ඇවිත් 'ආ  ප්‍රොෆෙසර් රණබන්දු මාව මතක නැතුව ඇති. මමත් පේරාදෙණියෙ හිටිය. මම බන්දුල වීරහේවා' කියා අතට අත දුන්නා. මෙහිදී යම් යම් පුද්ගලයින් පැමිණ බොරු හැඳුනුම් කම්, අහිංසකකම් පෙන්වා වංචාකාර ක්‍රියා වල යෙදෙන බව කලක් මෙහි සේවය කර, දැනට ලංකාවේ සිටින මගේ මිත්‍රයෙකු වූ ජයසුමන කී කතාව මට සිහියට නැගුනේ නිතැතින්. මම ඔහු දෙස බැලූවේ මහත් විමසීමකින්.

'ප්‍රොෆෙසර් මම කලේ ජියොග්‍රෆි. මම ෆයිනල් ඉයර් එකේ හිල්ඩා එකේ ඉන්න කොට පොෆෙසර් ඒකෙ සබ් වෝඩ්න් කෙනෙක්.' මගේ හිතේ බය ටිකක් අඩු වුනා. මම හැත්තෑ අටේ හිල්ඩ එකේ හිටි නිසා. ඒත් සැකය තවමත් මගේ හිතේ.

'අපි යමු නායක ස්වාමීන් වහන්සෙ හමුවෙන්න. ඊට පස්සෙ බුදුන් වඳිමු.'

'ආ බන්දුල මහත්තයෝ. කොහොමද ටික කාලයකින් දැක්කෙ නැහැ. මේ මහත්තයා?

'එහෙමයි ස්වාමීනි'. මේ පොෆෙසර් රණබන්දු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මලයා විශ්ව විද්‍යාලයට ඇවිල්ලා සම්මන්ත්‍රනයකට.'

'බොහෝම හොඳයි රණබන්දු මහත්තයෝ. දැන් ලංකාවෙන් ඔය වගේ මහත්තුරු ඇවිල්ලා දේශන පවත්වන එක කොච්චර ලොකු දෙයක්ද? මහත්තයල බුදුන් වන්දනා කළාද?'

'නැහැ හාමුදුරුවනේ'

'එහෙනම් බුදුන් වැදල එන්න. මහත්තය ටික දිනක් ඉන්න නිසා ආපහු යන්න ඉස්සර මුණ ගැහෙමු.'

'හොඳයි හාමුදුරුවනේ'

ඊට පස්සෙ මගෙ හිතේ තිබුණ සැකය සම්පූර්ණයෙම්ම නැති වුනා.

බුදුන් වන්දනා කළ අපි සාලාවේ බංකුවක වාඩි වූයේ ගිමන් නිවා ගැනීමට. තේ එකක් බීව නම් හොඳයි කියල මට හිතුනා. එය ඉවෙන් මෙන් දැන ගත් බන්දුල කුස්සියට ගොස් තේ දෙකක් හදා ගෙන ආවා.

'හරිම අගේ ඇති තේ එත බන්දුල. ඇඟට පනක් ආවා.'

'කොච්චර රස්නෙ උනත් උණු තේ එකක් බොන කම් හරි යන්නෙ නෑ.'

'බන්දුල මෙහේ හුගක් කල් ද පදිංචිය?'

'ඔව් අපි ආවෙ අසූ පහේ අර කලබල කාලෙ. ළමයි දෙන්නම ඉපදුනෙ මෙහේ'

'එහෙනම් ඒ දෙන්න දැන් ලොකු ඇති'.

'ඔව් ලොක්ක පුතා. එයා ඩිග්‍රි එක කළේ මෙල්බර්න් වල. දැන් එයාට එහේ රෙසිඩන්සි ලැබුණා. එහේම වැඩ කරනවා දුව දැන් මලයා විශ්ව විද්‍යාලෙ මෙඩිසින් කරනවා. දෙවෙනි අවුරුද්දෙ. නෝනත් ඒකෙ ඉංගීසි උගන්වනවා. මම වැඩ කරන්නෙ ග්ලෝබල් ඉන්ෂුවරන්ස් කම්පැණි එකක. එකවුන්ටන්ට්. දැන් භූගෝල විද්‍යාව මතකත් නැහැ' බන්දුල කිව්වෙ හිනා වෙමින්.

'මට මතකයි ප්‍රෙෆෙසර් ඒ කාලෙ ලංඩන් ගියා. එල්එස්ඊ එකට පීච්ඩී කරන්න. මම හිතන්නෙ ඒ හැත්ත නමයෙ අවුරුද්ද. මම එතකොට ජියොග්‍රෆි ටියුටර් කෙනෙක්.'

'මේ බන්දුල මට රණේ කියන්න ඒ ඇති'.

'කොහොමද බන්දුල මෙහේ ජීවිතය හොඳද?'

'මෙහේ ජීවන තත්වය හරිම හොඳයි. ඒත් ලොකු පුතා කියනව ඕස්ට්‍රේලියාවෙ පදිංචියට එන්න කියල. ඒ වුණාට අපි තවම තීරණයක් ගත්තෙ නැහැ. දැන් රටවල් තුනක් එක්ක අපි ජීවත් වෙනවා' බන්දුල කිව්වෙ හිනා වෙමින්.

'ඕස්ට්‍රේලියාව නම් හරිම හොඳ රටක් ජීවත් වෙන්න. මමත් කීප වතාවක් ම ගිහිල්ල තියෙනව'

'දැන් රණේත් ලෝකෙ හැම රටකටම වගේ ගිහිල්ල ඇති නේ. ඒත් ලෝකෙ කිසිම තැනක් ලංකාව වගේ අපිට හරියන්නෙ නෑ. එහේ සාමකාමී වාතාවරණයක් තියෙනවනම් හුඟ දෙනෙක් කැමතියි ගිහිල්ල එහේ සේවය කරන්න.'

'ඕක බන්දුල විතරක් නෙවි, හැම රටකම වගේ ඉන්න අය තමන්ගෙ වාසියට කියන කතාවක්. එහෙම හිතන්න එපා. කියන්න එපා. දැන් බලන්න අපිත් ලංකාවෙ ඉඳගෙන රටට සේවයක් කරනවනේ. රටේ තියෙන ප්‍රශ්න අපේ පශ්න කර ගත්තොත් කොහේවත් ඉන්න බැහැ.'

'ඒක නම් ඇත්ත තමයි රණේ. රට, ජාතිය, ආගම, භාෂාව වගේ දේවලට අපි ගරු කරන්න ඕන. ඒත් මනුෂ්‍යයන් විදියට සාරධර්ම තුලින්'
.
'ඔව් ඒවට අපි ගරු කරන්න ඕන. දෙමාපියන්ට වගේ. බොහෝම ආදරයෙන්'.

'ඒක නම් ඇත්ත තමයි රණේ. දුව ඉගෙන ගෙන ඉවර උනාම අපිත් තිරණයක් ගන්නව. මැලේසියාවද? ඕස්ටේලියාවද? ලංකාවද? කියල. අපේ ලකුණු දීම ලංකාවට 50% මැලේසියාවට30% ඕස්ටේලියාවට 20% යි.'

'මට බන්දුල වගේ කෙනෙක් හමු වුන එක ලොකු දෙයක්. නැතිනම් මේ වගේ කතා කරන්න කෙනෙක් හොයා ගන්න එක හරිම අමාරු වෙනව.' මම කිවේ හිනා වෙමින්.

'ඔයා ලියපු කෙටිකතා, නවකතා කීපයක්ම මම කියෙව්වා. ආර්ථික විද්‍යා පොත් වාගේම සිංහල නවකතා ලියන්නත් ඔයාට වෙලාව කොහෙන්ද?'

'දන්නවද බන්දු අපේ අම්මා මට පොඩි කාලෙ කිව්ව නෑ, බෑ කිව්වොත් පුතේ හැමදාමත් නෑ, බෑ තමයි. ඒ නිසා ඒවා ශබ්ද කෝශයෙන් ඉවත් කරගන්න කියල. ඉතිං මම ඒක කළා. අනික මට අපේ නෝනත් උදව් කරනව. එයා තමයි මම ලියන ඒව කියවල ටයිප් කරන්නෙ. ඒක මට හරිම ශක්තියක්.'

'රණේ ලියන හැම කතාවක්ම අවසන් වෙන්නෙ ජය ගැනීමකින්. එහෙම නැතිනම් ශුභ සතුටු දායක ප්‍රතිඵලත් සමග. ඇයි ඒ?'

'අපි බෞද්ධයෝ උනත්, කර්මඵල වාදය තදින් විශ්වාස කලත්, හැමදාම බලාපොරොත්තු වෙන්නෙ ජයක්. පරාජයක් ගැන හිතන්නෙවත් නැහැ. නැතිනම් අදට වඩා හොඳ හෙටක්. ඒ නිසා මම කැමති නැහැ කිසිම කතාවක් පරාජයකින්, දුකකින් අවසන් කරන්න. යථාර්තය ඒක නොවුණත් කතාවක ජයාත්මක, නැත්නම් සතුටුදායක අවසානයක් ඇතිවීම නිසා පාඨකයාටත් ඇති වෙන්නෙත් හරිම සතුටක් සැනසිමක්.'

'ඇත්ත තමයි. රණේගෙ කතා කියෙව්වම ඇති වෙන්නෙ හරිම සැනසීමක්. බලාපොරොත්තුවක්. අර පොඩි කාලෙ අපි හඳ පායන තුරු බලන් ඉන්නව වගේ, රෑට වත්තට ගිහිල්ල සෙල්ලම් කරන්න. හඳ පෑව්වම අපේ බලාපොරොත්තුව විශාල සතුටකට පත්වෙනවා. ඉතිං අපි වත්තට පැනලා යාලුවො එක්ක හොඳටෝම සෙල්ලම් කරනවා.'

'ඔයා දන්නෙ නැති උනාට මගෙ අලුත් පොතට දාන්නත් හිටියෙ 'සුපුන් සඳ පායන තුරු' කියල. නිර්මාණයක රස විඳීමේ අවසානය සහනදායී හැඟීමක් විය යුතුයි කියල මම හිතන නිසා.

'රණේ ලියනව නම් මම හොඳ කතාවක් කියන්නම්. මේක මටම උන දෙයක්. මේ පන්සල් භූමියෙන්මයි පටන් ගන්නෙ අවුරුදු දෙක තුනකට උඩදි'

'ඒක නම් හරිම හොඳයි බන්දුල. මෙහාට එනකොට මම හිතන් ආවෙ කතාවක් ලියන්න ඕන කියල. මගේ අලුත් පොතට එකතු කරන්න. එහෙනම් ඔයාගෙ අත්දැකීම පාදක කරගෙන මම කතාවක් ගොනු කරන්නම්.'

'දැන් අපේ ගෙදර යමු රණේ. රෑට කෑම ටිකක් කන්නත් එක්ක. මම නෝනට කෝල් කරල කියන්නම් පරණ යාලුවෙක් එක්ක එනව කියල. එයාටත් රණේව මතක ඇති මම හිතන්නෙ. මම රෑ වෙලා ඉන්න තැනට ගිහිල්ලා බස්සවන්නම්. අපි ඉන්නෙත් ඒ ලඟම පෙටලින් ජයාවල.'

නායක ස්වාමීන් වහන්සේගෙන් සමු ගත් අපි කාරයට නැග්ගේ මහත් සැනසීමකින්. කාරය පන ගැන්වූ බන්දුල 'මම අර කතාව දැම්මම පටන් ගන්නම්. මොකද ඒක පටන් ගන්නෙත් මෙතනින්නේ'

'හා හොඳයි බන්දුල අපි තවමත් පන්සල ලඟනේ' මම කිව්වෙ හිනා වෙමින්.

'ඒ දවස් වල අපේ නෝනයි දුවයි ලංකාවට ගිහිල්ල මගුල් ගෙදරකට. පුතත් නිවාඩුවකට ගෙදර ඇවිල්ල, ඕස්ටේලියාවට ගියා විතරයි. මම විතරයි ගෙදර. එදාත් සෙනසුරාදා දවසක්. මට හිතුන පන්සල පැත්තෙ යන්න ඕන කියල. මට පොඩි වැඩ වගයකුත් කරගන්න තිබුන. මම හිතන්නෙ පන්සලට එනකොට හවස හයට විතර ඇති.'

'ඉතිං ඉතිං'

'මම ඇතුල් වෙන කොටම දැකල පුරුදු වගේ මූනක් තියෙන, වයස විසි පහක විතර තරුණ හාදයෙක්, හිනා වේගෙන මගේ ළඟට ආව.'

'ආ අංකල් ලංකාවෙ ඉඳලද ආවෙ. නැතිනම් මෙහේද ඉන්නෙ?' එයා ඇහුව.

'ඔය වගේ වංචාකාරයො මට මෙහෙදි හරියට හමු වෙලා තියෙනවා. පහු ගිය අවුරුදු විස්ස විසි පහක කාලය අතර අනන්තවත්. ඒත් මෙයා ගැන මට සැකක් ඇති උනේ නැහැ. මිනිහ හොඳට ඇඳලත් හිටියෙ. අනෙක පන්සල් වත්තෙ නේ.'

'ඔව් පුතා මම මෙහේ ඉන්නෙ. ගම වේයන්ගොඩ ඔයා කොහේද?'

'තාත්තගෙ ගම කැකිරාවෙ. දැන් අපි ඉන්නෙ කලුතර.'

'පුතාගෙ නම?'

'මගේ නම ගුණනාත්. ඒත් යාලුවො මට කියන්නෙ ජිනාත් කියල ලේසියට. මේ මගේ යාලුවෙක් ලකී. ලංකාවෙ ඉඳල ඇවිත් ඉන්නෙ බොහොම දක්ෂ නැටුම් ශිල්පියෙක්.'

'ඇයි යාලුවො ඔයාට ජිනාත් කියන්නෙ. ගුණනාත් කියන නම බොහොම හොඳ සිංහල නමක්නෙ?'

'කව්රු හරි නාත් කියන එක නාන් කියල වෙනස් කලොත් එහෙම.' මම කිව්වෙ සිනාසෙමින්. මිනිහට ඒක තේරුම් ගන්න තරම් ශක්තියක් නැති බව මට තේරුනේ පස්සෙ. කතාවෙන් කතාවෙන් අපි දැන් බුදු ගේ ළඟටම ඇවිල්ල.

'කොහේද ජිනාත් ඉන්නෙ?'

'මම ඉන්නෙ ෂාලම් වල. ලංකාවෙන් ආපු කට්ටියක් එක්ක, චමරියක. සමහරු එක්ක නම් ඉන්න හරිම අමාරුයි. සමහර අයගෙ තත්වය හරිම පහළයි. ඒ නිසා මම පන්සල පැත්තට නිතර එනවා. සෙන්තුල් එකටත් යනවා. ඔහු විදහා දැක්වූයේ බොහොම දර්ශනීය චිත්‍රයක්.'

'එතකොට වැඩ කරන්නෙ?'

'ෂාලම් කොම්පැණියක. අවුරුදු තුනකට තමයි ඇවිල්ල ඉන්නෙ. ඒත් ලබන අවුරුද්දෙ යනව බඳින්නත් එක්කම. අන්කල් බුදුන් වැඳල එන්න.'

මම බුදු ගෙයින් එලියට එන කොටම මිනිහ දුවගෙන ආවා.

'අංකල්. ලකී තේ ටිකක් හැදුවා. යමු බොන්න.'

'හා හොඳයි'

'එහෙනම් ගුණනාත් මට පන්සලේ වැඩ වගයක් කරන්නත් තියෙනවා. වෙලාවක මට කතා කරන්නකො. මෙන්න මගේ නොම්මරය. මේ දවස් වල මම විතරයි ගෙදර ඉන්නෙ ඒ නිසා හවසක එන්න.'

'හා හොඳයි අංකල් මෙන්න මගේ නොම්මරය.'

' ඒක එහෙනම් මගේ ෆෝන් එකටම දාන්න. නැතිනම් නැතිවෙයි'.

'Gnath 016732 . . . .'

'හොඳයි එහෙනම් පස්සෙ හමු වෙමු'

මිනිසුන්ගේ මුහුණේ ඉරියව් කතා බහ අනුව ඔවුන් හඳුනා ගැනීමට ශක්තියක් ඇති මම ඔහු දුටුවේ අවංක තරුණයෙකු ලෙස. සමහර විට මට මෙයාව අපේ පුතා සමග සැසඳෙන්න ඇති.

'කතාවෙන් කතාවෙන් ගෙදර ළඟටම ඇවිල්ල නේ.'

'රණේ මේ ශ්‍රියාණි. ශ්‍රියාට මතකද ප්‍රොපෙසර් රණබන්දු. අපට වඩා අවුරුදු දෙක තුනකට සීනියර්. ඉකොනොමික්ස් කළේ.'

'එතකොට අර ප්‍රියංකා ගොරකදෙනිය හිටියෙ ඔයාල එක්කද?'

'ඔව් ඔව් එයා තමයි මගේ රූම් මේට්,. රාමනාදන් ඉන්නකොට. මොකද දන්නෙ නැහැ බන්දු නේද? මනෝ රංජනී කෙනෙක්ද' ඇය සිනාසෙයි.

'අනේ නෑ ශ්‍රියාණි. එයා මගේ නංගිගෙ ක්ලාස් මේට් කෙනෙක්. ඒ නිසා දන්නව.'

'සර් මැරි කළේ අර ධම්මිකා රණගලවද? නැත්නම්.....'

'ඔව් ඔව් ඔයාට මතකද ධම්මිව?'

'නැතුව නැතුව එයත් රාමනාදන් හිටියනේ කාලයක්. සර් ඒ කාලෙ රාමනාදන් එන කොට අපි කියන්නෙ, ඉල්ලුම් සැපයුම් වක්‍ර ගසාගෙන - රණයා එනවා ප්‍රේමෙ සොයාගෙන කියලනේ.' ඇය මහ හඬින් හිනැහෙයි.

'බලන්න බන්දු, ඒ කාලෙ ගෝලයො අපිට කාඩ් ගහල තියෙන හැටි'

'ශ්‍රියා මම මේ රණේට කිය කියා හිටියේ අර ජිනාත් ගෙ කතාව. මොකද රණේ තව පොතක් ලියනවලු.'

'ඒක නම් හොඳයි. ඒ වගේ කතාවල් ලියල මිනිස්සු දැනුවත් කරවන්න ඕන. නැතිනම් නොදන්න මිනිස්සු ගරහන්නෙ මුලු සිංහල ජාතියටම. ඒක අපිටත් ලජ්ජාවක්.'

'ඔව් ඔව් මේ සත්‍ය කතාව අපි ලියමු කෙටි කතාවක් විදියට'.

'සර් මම මාතෘකාව දෙන්නම් මුලින්ම. 'නරියෙකුට රැවටුන සිංහයෙක්'. මොකද දන්නවද? මෙයා හැමෝටම බණ දේශනා කරනව. අන්තිමට කොහේද යන වලිගයක්වත් නැති නරියෙකුට රැවටුනා. සල්ලි වලටත් වඩා මෙයාට කනගාටු ඒක සිදුවුන විදියට. මීට පස්සෙ නම් ඔය වගේ අය දැක්කම අපි අහක බලාගන්නව.'

'ශ්‍රියා ඔයා දැන් ඉරෙන් පැනලනේ. රණේ තවම මොකුත් දන්නෙ නැහැ අපි තවම ටෙලිෆෝන් අංක මාරු කරගත්ත විතරයි' බන්දු මහ හඬින් සිනාසෙයි.

'සර්ට මොනව හරි බොන්න ගේන්න.'

'රණේ මූණ පොඩ්ඩක් සෝද ගන්න. මේ මෙතන බාත් රූම් එක.'

'දුව....... ලංකා.... ඇවිල්ල මේ අංකල්ට කතා කරන්න. මේ අංකල් මට පේරාදෙණියේදි උගන්නල තියෙනව'

'මේ ගොල්ලො සිංහල කතා කරනවද?'

'ඔව්, මොකද අපි ගෙදරදි කතාව, වැඩ ඔක්කොම සිංහලෙන්. නැති නම් අපි ලංකාවෙ, අපි සිංහල කියල බෝඩ් එල්ලගෙන කැමරා වලට මූන දුන්නට වැඩක් නැනෙ. අඩුම තරමින් ගෙදරදි වත් සිංහල කතා කරන්න ඕන. එතකොටනේ ළමයින්ට සිංහල ඉගෙන ගන්න පුලුවන් වෙන්නෙ.'

'ඒක නම් ඇත්ත තමයි ශ්‍රියාණි. පිටරටවල ඉන්න අය තමයි එහෙම හිතන්නෙ. ඒත් ලංකාවෙ ඉන්න සමහර අය හිතන්නෙ සිංහල නොදන්න බව ඇඟවීම ලොකු දක්ෂ කමක් කියල.'

'භාෂා කීපයක් දැන ගෙන ඉන්න එක ජීවිතේට කෙතරම් ප්‍රයොජනවත්ද? අපි මැලේ, දෙමල භාෂා දෙක මෙහේ ආවට පස්සෙ ඉගෙන ගත්තා. භාෂා හතරක් දන්න එක කොච්චර හොඳද?'

'දුව කෑම මේසෙ ලස්සනට හදල මගේ සර් කෙනෙක් ආව කීවම. එහෙනම් අපි කෑම ටිකක් කාල ඉඳිමු.'

'බන්දු මම ලංකාවට කතා කරල ඔයාලගෙ නොම්මරේ දෙන්නම් ධම්මිට. එතකොට එයාට කතා කරන්න පුලුවන්. නැතිනම් රෑ උනාම එයා හෝටලේට කතා කරල අප්සෙට් ගහයි මම නැති උනාම.'

'ආ ඒක හොඳයි මෙන්න මම ඉන්ටනැෂනල් කෝඩ් එක දැම්මා. දැන් ගෙදර නොම්මරය ඩයල් කරන්න.'

මගේ විස්තර කිරීමෙන් පසුව පේරාදෙනියේ සිටි යුවලක් හමු වූ බව ඇසූ ධම්මි ඉතා සතුටට පත් උනා.

'දුව ලංකා... මේ අංකල්ට තව මාලු කෑල්ලක් බෙදන්න.'

'නෑ නෑ එපා දුව. මම හොඳටම කෑවා. වෙනද වගේ දෙගුණයක්. කෑම හරිම රසයි ලංකාවෙ වගේමයි.'

'රණේ එහෙනම් ලබන සෙනසුරාදා අපි මෙලෙක්කා යමු. එදා රෑට මෙහේ නැවතිල ඉරිදට පුත්‍ර ජයාවල ඇවිදින්න යමු. ලබන සැරේ එනකොට නෝනයි බබාලයි එක්ක ගෙනම එන්න. මෙහේ ඉන්න පුලුවන්. ගෝලය හොඳට සලකයි.' බන්දුල කිව්වෙ මහ හඬින් හිනා වෙමින්.

'මම හිතන්නෙ මට දැන් කෙටි කතාවකට නෙවෙයි නවකතාවක්ම ලියන්න කරුණු තියෙනවා. අපි ආයෙත් ජිනාත්ගෙ කතාව පටන් ගමුද?'

'ශ්‍රියා ඔයත් එන්න.'

'හා හා මම තේ ටිකකුත් හදා ගෙනම එන්නම්. සර්ට හොඳට සළකන්න ඕන. අවුරුදු විසි ගණනකට පස්සෙ නේ මේ දකින්නෙ.' ශ්‍රියා කීවෙ හරිම සතුටෙන්.

'මට දැන් ජිනාත් ගෙ කතාවෙ ඉතුරු හරිය හිතාගන්න පුලුවන්.'
'දවස් තුන හතරකට පස්සෙ ජිනාත් මට ඔෆිස් එකට කෝල් කරල කීවා එයා දැන් වැඩ ඉවරයි. මම ගෙදර ඉන්නව නම් හවසට ඒ පැත්තෙ එන්නම් කියලා. මම කීවා මං එනකොට හය විතර වේවි, ඇවිල්ල පෙවලින් ජයා වල කාෆෝ එක ළඟ ඉන්න කියල. ඉතිං එදා මට හදිසි ඇමතුමක් ආ නිසා ගෙදර එන්න ටිකක් පමා උනා. ඒ අතරෙ ජිනාත් මට තුන් පාරක් කතා කළා. මම කිව්ව හදිසි නම් ඔයා යන්න මම එනකොට ටිකක් පමාවෙයි කියල. ඉතිං ජිනාත් කිව්ව කමක් නෑ මම අංකල් එනකම් එතන ඉන්නම් කියල.'

'ම්හ් ...කොහොමද මිනිහගෙ පැල්න් එක පැයක් දෙකක් හිටියට මොකද වෙන්නෙ?' ඒ ශ්‍රියා.

'මම එනකොට රෑ හත විතර උනා. ජිනාත් එතන හිටියා. අපි ගෙදරට එන තුරු මුන ගැහුන වෙලේ ඉඳන් මිනිහා කතා කළේ ධර්මය ගැන. ඒ නිසා මටත් හරි සතුටුයි.'

'බලන්න හරිම කපටියෙක් නේ. ජීවිතය පටන් ගන්නෙ ඔහොමනම් ඉවර වෙන්නෙ කොහෙන්ද?'

'හොඳ සල්ලි කාරයෙක්, මිලියනය කෙනෙක් වෙලා. ඒත් අන්තිමට හිරේට යයි, හිඟන්නෙක් වගේ. ඒක තමයි ධර්මය.'

ගෙදරට ගියාට පස්සෙ ජිනාත් කීව 'අංකල් චොකලට් කනවද? මම නිකං ඉන්න නිසා අරගෙන කෑව. තව එකක් තියෙනව කියල.'

'මම පස්සෙ මිනිහ එක්ක ළඟ කඩේකට ගිහිල්ල රෑට කෑම කෑව. හුඟක් රෑ උනාට පස්සෙ  එයා ගියා.'

'මයි ගෝඩ් හොඳ වෙලාවට ගෙදර ඉන්නද කියල ඇහුවෙ නැහැ. ඇහුව නම් මම හා කියන්න හොඳටෝම ඉඩ තිබුණ. එහෙනම් අර තාපස තුමා හොරෙකුට මහන කම දීල කහවනු පොදිය නැති කරගත්තා වගේ වෙන්න තිබුණා මටත්. මෙයා ගැන කිසිම සැකක් ඇති උනේ නැහැ. ඊට පස්සෙ සෙනසුරාදා මට පන්සලේ මීටිමකට යන්න තිබුණ. මම ඒකට යන්න හදන කොට ජිනාත් කෝල් කරල කියනව 'අංකල් අද පන්සල් යනව කිව්ව නේද? මමත් දැන් වැඩ ඉවරයි මමත් එන්නම් අංකල් එක්ක යන්න'

මම කීව හා හොඳයි එහෙනම් හතරට විතර එන්න කියල.

මිනිහ එනකොට පහට විතර ඇති. මෙයා ආවෙලාවෙ ඉඳල කවුදෝ තුන් හතර සැරයක් කතා කළා. බලන්න මට ඒත් කිසිම සැකයක් ඇතිඋනේ නැහැ.

'අංකල් මේ මගෙ මැලේ යාලුවෙක්. එයා ලංකාවෙ ඒජන්සි එකක් හොයනව මිනිස්සු මෙහාට ගෙන්නන්න. මම ආපු ඒජන්සි එක මිනිහට අල්ලල දෙන්නයි ඉන්නෙ. එයා මාව හයට විතර කාෆෝ එක ළඟදි හමුවෙනව කීව. ඒ නිසා මට පන්සලට යන්න බැරිවේවි.'

'නෑ කමක් නෑ වෙන දවසක හමුවෙමු කියල මං කීව.'

'ඊට පස්සෙ මිනිහගෙ ඇස්වල කඳුලු. මට පහුගිය දවස්වල  හරියකට නිදා ගන්නත් බැරි උනා. ලංකාවෙ පොඩි ප්‍රශ්ණයක් නිසා. මට සීය ලියල දුන්න කැකිරාවෙ තියෙන එයාගෙ ඉඩමක්. මම ඒක උගස් කරල යාලුවෙකුට පිටරට යන්න රුපියල් හැත්තපන්දාහක් අරගෙන දුන්න. යාලුව දැන් මාස හයකින් සල්ලි ගෙවල නැහැ. උගස් කාරය ඒක විකුණන්න යනව. සීය දැන ගත්තොත් මා එක්ක හොඳටම තරහ වේවි. මගේ චමරියෙ ඉන්න යාලුවො එකතු කරල මට රිංගට්  අට සීයක් දුන්නා. මගේ ළඟත් දාහක් තියෙනවා. තව පන්සීයක් විතරයි අඩු. අංකල්ට පුලුවන් නම් ලොකු උදව්වක් මම ලබන පස් වනදා පඩි ගත්තු ගමන් ගෙනත් දෙන්නම්.'

මගේ හිත හොඳටෝම උණු උනා, මේ කොලුවෙක් අඬනව දැකල. මම කීව මගේ ලඟ නම් දැන් සල්ලි නැහැ මට දැන් යන්න තියෙනව. රෑට මට කෝල් කරන්න කියල. මිනිහ ගේ ඇතුලත් විපරම් කරල බැලුව. ඒත් මට සැක හිතුනෙ නැහැ. මොකද හමුවුනේ පන්සලේදි නේ.' හිනාව අතරින් බන්දු කීව.

'එහෙනම් මිනිහට දිට්ඨ ධම්ම වේදනීය කර්මයක් විපාක දෙන්න එනව වගේ. පන්සලට ගිය එකේ සුභ විපාක.'

ඒත් මට උනේ ඊට ප්‍රති විරුද්ධ දෙයක්. 'අප්පියෙහි සම්පයෝගෝ දුක්ඛෝ' බන්දුගෙ ප්‍රති උත්තරය. පහුවදා මම උදේ ඇවිදින්න ගිහින් එනකොට අල්ලපු ගෙදර මොහොමඩ් දුවගෙන ආවා.

'සෙලමට් පාගි බන්දු(සුභ උදෑසනක්)' කියල මැලේ වලින් කියල කීව. කව්දෝ අපේ වත්තේ ඉන්නව එයා බලාගෙන හිටිය කියල.

මම 'ටෙරිම කෂි (ස්තුතියි)' කියල ඉක්මණට ගියා බලන්න ජිනාත් ඇවිල්ල පඩිය උඩට වාඩිවෙලා ඉන්නව. කම්මුලට අත ගහගෙන, උඩ බලාගෙන. මිනිහ මාව දැකල 'ගුඩ් මෝනින් අංකල්' කිව්ව.

'ගුඩ් මෝනින් ජිනාත්  ඇයි කෝල් කලේ නැත්තෙ?'

'මේකෙ ක්‍රෙඩිට් ඉවරවෙලා අංකල්. උදේ දහයෙන් පස්සෙ කඩ අරින්නෙ. ඊට පස්සෙ දාගන්න ඕන.'

'තේ එකක් බොමුද?' මම වෙලාව බැලුව උදේ නවයයි.

'නෑ අංකල් එපා මගේ චමරියෙ ඉන්න යාලුවෙක් කිව්ව ඉතුරු සල්ලිත් අරගෙන දහයට සෙන්කුල් එනව කියල. ඒ නිසා මම යන්නම්.'

'ආ එහෙනම් මෙතන රිංගට් පන්සීයක්  තියෙනව. වැඩේ කරල මට කෝල් එකක් දෙන්නකො. මටත් කියන්න රිංගට් එකට රුපියල් කීයක් ගෙවනවද කියල. මමත් සල්ලි ටිකක් ලංකාවට යවන්න ඕන.'

'හා හොඳයි අංකල්. මම දවල් වෙලා කතා කරන්නම් ලබන සතියෙ හමුවෙන්නම් බොහොම ස්තුතියි කරපු උදව්වට. කවදාවත් අමතක වෙන්නෙ නැහැ. අනික අංකල්ව හමු උනේ සති කීපයකට උඩදි පන්සලේදිනේ.'

'බලන්න කොච්චර කපටි තරුණයෙක්ද? තරුණ කාලෙ ඔහොම නම් ලොකු වෙන කොට  ලෝකෙ හෝදල වතුර බෝවි.'

'ඉතිං මම එයාගෙ කෝල් එක බලාගෙන ඉන්නව, සෙන්කුල් ගිහිල්ල ශ්‍රියාට සල්ලි ටිකක් යවන්න. තවමත් මට ඕක කරගන්න බැරි උනානෙ.' කීවම ශ්‍රියාණිට හොඳටම හිනා.

'ඉතිං.'

'ඉතිං මම සඳුද නිකමට කතා කලා බලන්න, අඩුගානෙ මිනිහගෙ වැඩේ කරගත්තද අහන්න. මිනිහ හලෝ කියල ෆෝන් එක කට් කලා මම බව දැනගෙන.'

'නියමයි නේද දෙවෙනි රස්සාව?'

'ඊට පස්සෙ මිනිහගෙ ෆෝන් එකේ කියනව මැසේජ් එකක් තියන්න කියල. මම ඒකටවත් උත්තර දුන්නෙ නැහැ. දවසක් මම ඔෆිස් ෆෝන් එකෙන් කතා කලා ඒත් හලෝ කියල  මම බව දැනගත්ත විතරයි කට් කලා.'

'මම හිතන්නෙ රිංගට් පන්සීය මිනිහගෙ මාසෙක පඩිය වෙන්න ඇති. ඒ නිසා කොහොමද මිනිහ ඒක ගෙවන්නෙ. හැබැයි මිනිහ මට ඇත්ත කිව්වනම් මට ඒක නිකන් දෙන්න තිබුන. හරිම කට්ටයෙක්. වෙට්ට පිත්තලයෙක්. ලංකාවේදිත් හොරකමක් කරලද දන්නෙ නෑ මෙහෙට පැනල ඉන්නෙ.'

'ඕක ඔතනින් බේරුනා ඇති.'

'ඒක තමයි රණේ. අර මෝහිණී දැක්ක කෙනා ලස්සන ගෑණු ළමයි දැක්කමත් බයෙන් පැනල දුවනව වගේ දැන්නම් ඔය වගේ කෙනෙක් දැක්කම පන්සලේදී නෙවෙයි දිව්‍ය ලෝකෙදි උනත් පැත්තවත් බලන්නෙ නැහැ.'

'ඒක තමයි සර්. ඔය නරිනාත් තව දවස් කීපයක් මෙහාට ආවනම් මෙහෙ තියෙන රත්‍රං බඩු කණකර ටිකත් අත පත ගාගෙන යාවි. හැබැයි මිනිහ වැඩි දුර යන එකක් නැහ. මම හිතන්නෙ. මිනිහ ඉක්මන් වුනා වැඩියි. නැති නම් මෙයාගෙ හාර පන්දාහකටවත් විදල.' ශ්‍රියා කිව්වෙ නෝක්කඩුවෙන්.

'මම මේ ගැන පන්සල් දෙකේම අයටයි දන්න සිංහල අයටයි කීව. බලන කොට හුඟ දෙනෙක් මේ වගේ අයගෙ උගුල් වලට අහුවෙලා. ඒකෙන් වෙන්නෙ අවංක කෙනෙකුටවත් අපෙන් උදව්වක් ගන්න බැරි වෙනවා. කොහොමටත් ඒ වගේ බැටලු හම් පොරවගෙන එන අයගෙන් ප්‍රවේශම් වෙන්න ඕන. නැතිනම් මේක අපේ ආගමටත් ලොකු කැළලක්.'

හොඳයි බන්දු. ඔයා ලබපු මේ අමිහිරි අත්දැකීම කතාවකට ගොනුකරල මෙහෙන් යන්න ඉස්සෙල්ල ඔයාලට එවන්නම්. එතකොට ඔය දෙන්නටත් ඒක තව රසවත් කරන්න පුලුවන් වේවිනේ. මේක මගෙ කෙටිකතා එකතුවට එක් කරන්නම වටින කතාවක්.'

'සර්ට මම තව තේ එකක් හදා ගෙන එන්නම්.'

'ශ්‍රියා මට දැන් සර් කියන්න එපා. එතකොට මගේ වයසත් අහුවෙනව. රණේ කීවම ඇති.' මගේ කීමට ශ්‍රියාටත් හිනා. ශ්‍රියා නැගිට්ටේ තේ හදන්න.

'එපා ශ්‍රියා තැන්ක්ස්. දැන් රෑ දොලහටත් කිට්ටුයි. එහෙනම් මාව ගිහිල්ල බස්සන්න.'

'ශ්‍රියා එහෙනම් ඔයත් එන්න රණේව බස්සන්න යන්න. දුව තාම පාඩම් කරනවනේ.'

'එහෙනම් රණේ ලබන වීක් එන්ඩ් එක අපිත් එක්ක. සෙනසුරාදා මෙලෙක්කා ඉරිදා කේ.එල්. බාටු හින්දු කෝවිලත් බලන්න ඕන තැනක් මෙහේ ආවම.'

'හැබැයි රණේ ඔයාගෙ මේ කතාව අනික් කතා වගේ නෙවි. ඉවර වෙන්නෙ ජය ලැබීමකින් නෙවි.'

'ඇයි නැත්තෙ ඒක ඔයාට ලැබුන ලොකු අත්දැකීමක්. විශාල ජයග්‍රහනයක්. ශ්‍රියාණී කීව වගේ වෙන්න තිබුන විශාල පාඩුවක් රිංගට් පන්සීයකින් බේරුණා. ඒ නිසා මේක මගේ අනෙක් කතා වලට ගැලපෙනවා.' සැම දෙනාම සිනාසුනේ බොහොම සැහැල්ලුවෙන්

'දුව ලංකා මේ අංකල් යන්න හදනව. ඇවිත් කතා කරන්න.'

'ගුඩ් නයිට් අංකල්'

'ගුඩ් නයිට් දූ ඔයාල ලංකාවට ආවම අපේ ගෙදර එන්න. අපේ දූත් ඔයාට හරියට කැමති වේවි.'

'දුව එහෙනම් දොර වහගෙන ඉන්න. අපි අංකල්ව බස්සලා ඉක්මනට එන්නම්.'

මෙවැනි පැරණි සබඳතාවයක් ඇති මිතුරන් සිටීම, හමුවීම කොතරම් භාග්‍යයක්ද? ඔවුන්ගේ එකතු වීම මිළ කළ හැකිද? ඔවුන්ගේ හමුවීමෙන් අවුරුදු තිස් ගානක පේරාදෙණි අතීතය සිතුවම් පටක් ලෙස කාමරයේ තනි වූ මා ඉදිරිපස දිස් විය. කවුදෝ ලියූ ගීයක් මා සිහියට නැගුනේ නිරායාසයෙන්.
'හන්තානේ කඳු මුදුන සිසාරා.......'

(මෙහි එන නම් ගම් මනඃකල්පිත වුවත්, කතාව පදනම් වී ඇත්තේ සත්‍ය සිදුවීමක් ඇසුරිනි. ලිවීමට මා නිතර උනන්දු කරවන මා දයාබර ජයන්ති පීරිස් හා මෙහි අඩු ලුහුඬු කම් නැතිකොට සුදුසු ලෙස සකස් කිරීමෙන් හා ඉතා ආකර්ෂණීය ලෙස ටයිප් කිරීමෙන් සහාය වූ මා හිතමිත්‍ර සමන් සහ මලී දිසානායක යුවලට මගේ ස්තූති ප්‍රණාමය පිළිගැන්වේ).

ෂෙල්ටන් පීරිස්
සිඩ්නි විශ්ව විද්‍යාලය
(මැලේසියාවේ ක්වාලලම්පූර්හි මලයා විශ්ව විද්‍යාලයේ
සංඛ්‍යාණය පිළිබඳ හිටපු මහාචාර්ය)